ඉස්සෙල්ලාම මේ සීඩී තැටියේ තනුවක් නිර්මාණය කළේ ජගත් අයියා. 'චන්ද්‍රකාන්ති දී' කියන ගීතයට. ඊට පස්සෙ කළිඳු 'මවක් වුණා නුඹත්', 'නිම් නොමැති' සහ 'ඔබ යන්න ගිහින්' කියන ගී තනු නිර්මාණය කළා. 'මවක් වුණා' ගීතයේ තනුව කළිඳු අතින් නිර්මාණය වෙද්දි තනුවේ සමහර තැන්වලට ගැලපෙන පරිදි සාවින්දට වචන වෙනස් කරන්නත් සිදු වුණා. රොහාන් නෙත්සිංහ 'ස්ථිර ආලේ සොයලා' කියන ගීතයට තනුව නිර්මාණය කළේ අපේ ගෙදර ඉඳගෙනමයි. 'තනා සුවිසල් මාලිගේ' ගීතයට තනුව නිර්මාණය කළේ කැමරන් කොළඹගේ අයිය. මේ හැම දෙනාම තනු නිර්මාණය කළ ගීත වලට ඉහළම සාධාරණය ඉෂ්ඨ වෙලා තියෙනවා කියලා මට හිතෙනවා.

**සන්නස** - එතකොට ලංකාවෙන් සම්බන්ධ වුණේ?

**සෙව්වන්දිකා** - මේ ගීත පටිගත කිරීමේ දී රෝහණ වීරසිංහත් සුරේෂ් මාලියද්දේත් රෝහණ ධර්මකීර්තිත් ජානක ෆොන්සේකාත් දැක්වූ සහයෝගය අමතක කරන්න බෑ. ඔවුන් තමන්ගේම වැඩක් වගේ තමන්ගේම කෙනෙක් වගේ හිතලා මේ නිර්මාණ කටයුත්තට උපරිම අයුරින් දායක වුණා.

රෝහණ වීරසිංහ මෙහි ගීත 3 කට තනු හා සංගීතය නිර්මාණය කළා. ඊට අමතරව ඔහු විසින් රොහාන් නෙත්සිංහගේත් ජගත් ජේ එදිරිසිංහගේත් තනුවලට සංගීතය නිර්මාණය කළා. සුරේෂ් මාලියද්දේ, රෝහණ ධර්මකීර්ති ගීත 2 ක් බැගිනුත් ජානක ෆොන්සේකා, තරුපති මුණසිංහ, මහින්ද බණ්ඩාර, නවරත්න ගමගේ, කරුණාරත්න විජේවර්ධන ගීතය බැගිනුත් තනු හා සංගීතය නිර්මාණය කළා.

**සන්නස** - 'නෙතඟ නිලුපුල්' සීඩී තැටිය තවත් සුවිශේෂ වන හේතු කිහිපයක් ඔබට කියන්න තියෙනවා නේද?

**සෙව්වන්දිකා** - ඇත්තටම ඔව්. මෙම සීඩි තැටියේ යුග ගායනයෙන් සහභාගි වෙන්නෙ නන්දා මාලනී, රෝහණ වීරසිංහ සහ සුනිල් එදිරිසිංහ යන අය. මම හිතන්නේ මේ අය සමග මුල්ම ගීත තැටියේ ගී ගායනා කිරීමට ලැබීම ඉතා කලාතුරකින් කෙනෙකුට උදා වෙන වාසනාවක්. ඔවුන් මට සැලකුවේ ආධුනික ගායිකාවක් හැටියට නෙවේ. මගේ සංගීත දිවියට එක හිතින් සුබ පතමින්.

ඊට අමතරව රෝහණ සර් මා සමග ගයන යුග ගීතයේ ත් විශේෂත්වයක් තියෙනවා. ඒ තමන්ගේ පුතා (කළිඳු වීරසිංහ) තනුවක් නිර්මාණය කළ ගීතයක් හා හා පුරා කියලා ගායනා කරනවා. 'නිම් නොමැති අහසකට' කියන ගීතය. ඒ අවස්ථාව උදා වුණේ හරිම පුදුම විදියට.

මේ ප්‍රවීනයන් සමග කටයුතු කරන්න ඇත්තටම මට අවස්ථාව උදා කළේ කළිඳු. මේ සීඩී තැටිය ඉක්මනින් කරන්න කියලා මමත් සාවින්දත් උනන්දු කළේත් ඔහුමයි.

**සන්නස** - 'නෙතඟ නිලුපුල්' ප්‍රසංගය කොහොමද සංවිධානය වෙන්නේ?

**සෙව්වන්දිකා** - 'නෙතඟ නිලුපුල්' ප්‍රසංගය මගේ ප්‍රථම ඒක පුද්ගල ගී ප්‍රසංගයයි. එහිදී මගේ සීඩී තැටියත් එළි දක්වන්න කටයුතු කරලා තියෙනවා. ප්‍රසංගය මූලික වශයෙන් මගේ ගීත ගායනයෙන් ඔපවත් වෙනවා. මට ගීත ගායනයෙන් සහාය වෙනවා කළිඳු වීරසිංහ නාලක වීරකෝන් සහ පුෂ්පා තිසේරා. මෙම ප්‍රසංගයේ නර්තනය අමා සිරිවර්ධන විසින් නිර්මාණය කෙරෙන්නක්. ඊට අමතරව තවත් රසවත් අංග රැසක් ඔබට දැක බලාගන්නට පුළුවන් වේවි.

ඉතින් එදාට මේ ගී සංග්‍රහය රස විඳින්න ඔබ හැමෝම එයි කියල බලාපොරොත්තු වෙනවා.




ප්‍රවේශ පතක මිල ඩොලර් 10 යි ශ්‍රී ලාංකික වෙළඳසැල් වලින් ප්‍රවේශ පත් ලබා ගත හැකියි වැඩි විස්තර සඳහා පහත දුරකතන අංක අමතන්න
9546 1236 හො 0402 89 49 42



1 ඔබෙ සිතේ Obe sithe -
රවී සිරිවර්ධන/රෝහණ වීරසිංහ

2 අඬහැරය Andaheraya -
තරංග දන්දෙනිය/තරුපති මුණසිංහ

3 මවක් වුණා Mawak una -
වරුණ සාවින්ද/කළිඳු වීරසිංහ

4 සුළඟ නුඹ Sulanga numba -
වරුණ සාවින්ද/නවරත්න ගමගේ

5 ඔබ යන්න ගිහින් Oba ynan gihin -
වරුණ සාවින්ද/කළිඳු වීරසිංහ

6 සඳ මුවා වෙයි Sanda muwa wai -
වරුණ සාවින්ද/සුරේෂ් මාලියද්දේ

7 ස්ථිර ආලේ Sthira ale - වරුණ සාවින්ද/
රෝහණ වීරසිංහ/රොහාන් නෙත්තසිංහ(තනුව)

8 නිම් නොමැති Nim nomethi -
වරුණ සාවින්ද/කළිඳු වීරසිංහ

9 උරතලා Urathala -
ජගත් ජේ එදිරිසිංහ/රෝහණ ධර්මකීර්ති

10 බඳ රන් ගෝමර Banda ran gomara -
තුසිත් අබේනායක/ජානක ෆොන්සේකා

11 මුල් පාද පතුල Mul pada pathula -
වරුණ සාවින්ද/රෝහණ ධර්මකීර්ති

12 ආදරෙයි නොකියා Adarei nokiya -
වරුණ සාවින්ද/සුරේෂ් මාලියද්දේ

13 නෙතඟ නිලුපුල් Nethanga nilupul -
වරුණ සාවින්ද/රෝහණ වීරසිංහ

14 තනා සුවිසල් Thana suwisal -
වරුණ සාවින්ද/කැමරන් කොළඹගේ

15 අසුරු සැනින් Asuru senin -
සිසිර දිසානායක/කරුණාරත්න විජේවර්ධන

16 චන්ද්‍රකාන්ති Chandrakanthi - වරුණ සාවින්ද/
රෝහණ වීරසිංහ/ජගත් ජේ එදිරිසිංහ(තනුව)

17 ඔබ ගඟක් වගේ Oba gangak wage -
පද්මසිරි හේරත්/මහින්ද බණ්ඩාර

18 කඳුලු දහරට Kandulu daharata -
බන්දුල නානායක්කාරවසම්/රෝහණ වීරසිංහ




VINCENT RAUX & SONS PTY LTD
The Furniture People
RAUX
Australia Property Developer
AFS
ACTFAST FINANCIAL SERVICES PTY. LTD.
CAS2LAND
APCS
LIC. NO: 31742
TRICO
MARITIME AUSTRALIA PTY LTD
FAIRFIELDS
IMMIGRATION LAWYERS - MELBOURNE
We Deliver Results...